**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

අදියර 03 විභාගය - ජූලි 2026

## (3802) කළමනාකරණ ගිණුම්කරණය හා මූල්‍ය

(Management Accounting and Finance)

---

**සමස්ත විග්‍රහය:**

මෙම ප්‍රශ්න පත්‍රය ලකුණු 100ක් ආවරණය කරමින් කොටස් තුනකින් සමන්විත වේ.

1. **A කොටස** ලකුණු 20 ක් සඳහා අනිවාර්ය ප්‍රශ්න හතරකින් (1 - 4) සමන්විතය.
2. **B කොටස** ලකුණු 30 ක් සඳහා අනිවාර්ය ප්‍රශ්න තුනකින් (5 - 7) සමන්විතය.
3. **C කොටස** ලකුණු 50 ක් සඳහා අනිවාර්ය ප්‍රශ්න තුනකින් (8 - 10) සමන්විතය.

## A කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය මගින් **(a)** ඒකක වශයෙන් සමච්ඡේද ලක්ෂ්‍යය (BEP) සහ **(b)** ඒකක වශයෙන් ආරක්ෂිත ආන්තිකය (Margin of Safety) ගණනය කිරීම අපේක්ෂා කර තිබුණි.

**පොදු වැරදි පහත පරිදි විය:**

(1) සමහර අපේක්ෂකයින් මුළු විචල්‍ය පිරිවැය ගණනය කිරීමේදී විචල්‍ය පොදු කාර්ය සැලකිල්ලට ගෙන නොතිබුණි.

(2) ආරක්ෂිත ආන්තිකය ගණනය කිරීමේදී, අගයන් අඩු කරනවා වෙනුවට, අයවැයගත විකුණුම් ප්‍රමාණය, සමච්ඡේද විකුණුම් ප්‍රමාණයෙන් බෙදා තිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

අපේක්ෂකයින් මෙවැනිම ආකාරයේ ප්‍රශ්න පුහුණු විය යුතු අතර, සමච්ඡේද ලක්ෂ්‍යයේ අර්ථය සහ ආරක්ෂිත ආන්තිකය ගණනය කරන ආකාරය පිළිබඳව අවබෝධයක් ලබා ගත යුතුය.

**කාර්යසාධනය:**

එය සතුටුදායක මට්ටමක පැවතුණි. ඒකක වශයෙන් BEP සහ ආරක්ෂිත ආන්තිකය ගණනය කිරීම සඳහා අපේක්ෂකයින් ප්‍රශ්න පුහුණු වී තිබුණි. කෙසේ වෙතත්, බොහෝ අපේක්ෂකයින් **(a) කොටසට** වඩාත් හුරුපුරුදු වී සිටි අතර, ආරක්ෂිත ආන්තිකය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න පිළිබඳ අවබෝධයක් නොමැති වීම නිසා සමහර අපේක්ෂකයින්ට එය ගණනය කිරීම අපහසු විය.

## ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය මගින් 2026 මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා **Trade Ltd.** හි කාරක ප්‍රාග්ධන චක්‍රය (WCC) ගණනය කිරීම පරීක්ෂා කරන ලදී.

**අපේක්ෂකයින් විසින් සිදු කරන ලද පොදු වැරදි:**

(1) WCC ගණනය කිරීමේදී, වෙළඳ ගෙවිය යුතු මුදල් එකතු කිරීමේ දින ගණන, තොග පවතින දින ගණන සහ වෙළඳ ලැබිය යුතු මුදල් පියවීමේ දින ගණන එකතු කිරීම.

(2) වෙළඳ ණය හිමියන්ගේ කාලසීමාව සහ වෙළඳ ණය ගැතියන්ගේ කාලසීමාව ගණනය කිරීමේදී ණය හිමියන්ගේ සහ ණය ගැතියන්ගේ අගයන්හි සාමාන්‍යය ලබා ගැනීමට අමතක වීම.

(3) විකුණුම්වලින් 65% ක් පමණක් ණයට සිදු කර ඇති බව ප්‍රශ්නයේ පැහැදිලිව සඳහන් කර තිබියදීත්, සමහර අපේක්ෂකයින් ණය විකුණුම් වෙනුවට මුළු විකුණුම් ප්‍රමාණය භාවිතා කර ලැබිය යුතු මුදල් එකතු කර ගැනීමේ කාලසීමාව ගණනය කර තිබුණි.

(4) මිලදී ගැනීම් ගණනය කිරීමේදී, ප්‍රතිලෝම ගණනය කිරීම සිදු කරනවා වෙනුවට, සමහර අපේක්ෂකයින් විකුණුම් පිරිවැයට ආරම්භක තොග එකතු කර අවසාන තොග අඩු කර තිබුණි.

(5) සාමාන්‍ය අගය ලබා ගැනීම සඳහා ආරම්භක සහ අවසාන තොග නිවැරදිව භාවිතා කළද, අවසානයේ සාමාන්‍ය තොගය ලබා ගැනීමට අමතක කර තිබුණි

(6) කාරක ප්‍රාග්ධන චක්‍රය ගණනය කිරීමේදී, සමහර සිසුන් අදාළ ගණනය කිරීම් නොදක්වා පිළිතුර දින ගණනක් ලෙස පමණක් සඳහන් කර තිබුණි.

(7) සමහරුන් දින ගණනට පරිවර්තනය කිරීම සඳහා 365න් ගුණ කිරීමට අමතක කර තිබුණි.

(8) සමහර අපේක්ෂකයින් ගණනය කිරීම් සිදු කිරීමෙන් පසු කාරක ප්‍රාග්ධන චක්‍රය සඳහා වන සූත්‍රය යෙදීමට අමතක කර තිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

අපේක්ෂකයින් මෙවැනිම ආකාරයේ ප්‍රශ්න පුහුණු විය යුතු අතර, කාරක ප්‍රාග්ධන චක්‍රයේ අර්ථය සහ එය ගණනය කරන ක්‍රමවේදය පිළිබඳව අවබෝධයක් ලබා ගත යුතුය.

**කාර්යසාධනය:**

එය සතුටුදායක මට්ටමක පැවතුණි.

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය මගින් අයවැයකරණ ක්‍රියාවලියේදී ස්වයංක්‍රීයකරණය (automation) සහ විශ්ලේෂණාත්මක මෙවලම් (analytical tools) භාවිතය පිළිබඳ අපේක්ෂකයින්ගේ අවබෝධය පරීක්ෂා කරන ලදී. ස්වයංක්‍රීයකරණයේ ප්‍රතිලාභ හඳුනා ගැනීම සහ විශ්ලේෂණාත්මක මෙවලම් මගින් වැඩිදියුණු කළ අයවැයකරණ ක්‍රියාවලියකට සහාය විය හැකි ආකාරය පැහැදිලි කිරීම මෙහිදී අපේක්ෂා කෙරිණි.

**අපේක්ෂකයින් විසින් සිදු කරන ලද පොදු වැරදි:**

(1) **(b) කොටස** සඳහා, බහුතරයක් අපේක්ෂකයින් සාමාන්‍ය සහ අදාළ නොවන පිළිතුරු සපයන ලදී. පුරෝකථනය , ප්‍රවණතා විශ්ලේෂණය , විචලතා විශ්ලේෂණය හෝ අවස්ථා ආකෘතිකරණය වැනි ක්‍රියාකාරකම් හරහා විශ්ලේෂණාත්මක මෙවලම්වලට අයවැයකරණය වැඩිදියුණු කළ හැකි ආකාරය සඳහන් කරනවා වෙනුවට, බොහෝ අපේක්ෂකයින් තාක්ෂණයේ හෝ පරිගණක පද්ධතිවල සාමාන්‍ය වාසි පමණක් සඳහන් කළ අතර ඒවා අයවැයකරණ ක්‍රියාවලියට විශේෂිතව සම්බන්ධ නොකළහ.

(2) සමහර අපේක්ෂකයින් එකම කරුණු විවිධ වචනවලින් නැවත නැවතත් සඳහන් කළ අතර, අයවැයකරණ ක්‍රියාවලියට විශ්ලේෂණාත්මක මෙවලම් සහාය වන වෙනස් ක්‍රම තුනක් ඉදිරිපත් කිරීමට අපොහොසත් විය.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා:**

- පිළිතුරු සැපයීමට පෙර ප්‍රශ්නයේ ඇති නිශ්චිත අවශ්‍යතාවය සහ එහි භාවිතා කර ඇති කළයුතු ක්‍රියා ලැයිස්තුව පිළිබඳව දැඩි අවධානයක් යොමු කරන්න.
- අයවැයකරණයේදී ස්වයංක්‍රීයකරණය සහ විශ්ලේෂණාත්මක මෙවලම්වල යෙදීම් අධ්‍යයනය කරන්න; එමෙන්ම සැලසුම් කිරීම, පුරෝකථනය කිරීම, අධීක්ෂණය සහ තීරණ ගැනීමේදී ඒවා ආයතනවලට සහාය වන්නේ කෙසේදැයි වටහා ගන්න.

**කාර්යසාධනය:**

දුර්වල කාර්ය සාධනයක් පෙන්නුම් කෙරිණි. සැලකිය යුතු අපේක්ෂකයින් සංඛ්‍යාවකට අයවැයකරණ ක්‍රියාවලියේදී ස්වයංක්‍රීයකරණය සහ විශ්ලේෂණාත්මක මෙවලම්වල නිශ්චිත භාවිතයන් නිවැරදිව හඳුනා ගැනීමට නොහැකි විය.

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නය මගින්, අදාළ සහ අදාළ නොවන පිරිවැය හඳුනා ගැනීම සහ ව්‍යාපෘතියේ සමස්ත මූල්‍ය බලපෑම ගණනය කිරීම මගින් **x සමාගම** ව්‍යාපෘතියක් සඳහා ලංසුවක් ඉදිරිපත් කළ යුතුද යන්න තක්සේරු කිරීම අපේක්ෂා කරන ලදී.

බොහෝ අපේක්ෂකයින්ට අදාළ පිරිවැය කිහිපයක් හඳුනා ගැනීමටත්, ඔවුන්ගේ නිර්දේශයට සහාය වීම සඳහා අවශ්‍ය ගණනය කිරීම් සිදු කිරීමටත් හැකි විය.

**අපේක්ෂකයින් විසින් සිදු කරන ලද පොදු වැරදි:**

(1) සමහර අපේක්ෂකයින් එක් එක් පිරිවැය අදාළද නැද්ද යන්න සඳහන් නොකළහ.

(2) දැනට තොගයේ ඇති ද්‍රව්‍ය සඳහා, අපද්‍රව්‍ය ලෙස බැහැර කිරීම හරහා විකල්ප භාවිතයක් පවතින බවත්, එබැවින් ඒවාට අවස්ථික පිරිවැයක් පවතින බවත් හඳුනා ගැනීමට සමහර අපේක්ෂකයින් අපොහොසත් විය.

(3) පුහුණු සහ නුපුහුණු ශ්‍රමය සම්බන්ධ විවිධ තත්වයන් සලකා බැලීමකින් තොරව, බොහෝ අපේක්ෂකයින් සියලු ශ්‍රම පිරිවැය 'අදාළ පිරිවැය' ලෙස සලකන ලදී.

4) අපේක්ෂකයින් කිහිප දෙනෙකු තීරණය පමණක් ලබා දුන් අතර ව්‍යාපෘතිය සඳහා ලංසු තැබිය යුතුද යන්න තක්සේරු කිරීමට අවශ්‍ය අදාළ පිරිවැය ගණනය කිරීම් ඉදිරිපත් කිරීමට අපොහොසත් විය.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා :**

(1) අදාළ පිරිවැයකරණ මූලධර්ම, විශේෂයෙන් අදාළ පිරිවැය, ගිලුණු පිරිවැය ආදිය පිළිබඳ පැහැදිලි අවබෝධයක් වර්ධනය කර ගන්න.

(2) කිසියම් ගණනය කිරීමක් සිදු කිරීමට පෙර එක් එක් පිරිවැය අදාළ පිරිවැයක් ද නැතහොත් අදාළ නොවන පිරිවැයක් ද යන්න ප්‍රවේශමෙන් හඳුනා ගන්න.

(3) විස්තරාත්මක පිළිතුරු පමණක් ලබා දීම වෙනුවට හොඳින් ව්‍යුහගත ගණනය කිරීම් සමඟ නිගමනවලට සහාය වන්න.

(4) අතීත විභාග ප්‍රශ්නපත්‍ර සහ ස්වයං අධ්‍යයන පොත්වලින් වඩාත් අදාළ පිරිවැයකරණ ප්‍රශ්න පුහුණු වන්න

**කාර්යසාධනය:**

මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.

## B කොටස

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය මගින් පහත කරුණු පිළිබඳව පරීක්ෂා කරන ලදී:

- සාමාන්‍ය ඡන්ද හිමි කොටස්වල පිරිවැය කිරීම,
- නිදහස් කළ නොහැකි වරණීය කොටස්වල පිරිවැය
- නිදහස් කළ හැකි ණයකරවල පිරිවැය සහ
- වෙළඳපොළ අගයන් භාවිතයෙන් බරිත සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය.

**විභාග අපේක්ෂකයින් විසින් සිදු කරන ලද පොදු වැරදි:**

(1) බොහෝ අපේක්ෂකයින් සාමාන්‍ය ඡන්ද හිමි කොටස්වල පිරිවැය සහ නිදහස් කළ නොහැකි වරණීය කොටස්වල පිරිවැය නිවැරදිව ගණනය කර තිබුණි.

(2) සාමාන්‍ය ඡන්ද හිමි කොටස්වල පිරිවැය ගණනය කිරීමේදී සමහර අපේක්ෂකයින් ලාභාංශ වර්ධන ආකෘතිය වැරදි ලෙස හඳුනාගෙන තිබුණි. ප්‍රශ්නයේ ලාභාංශ වර්ධනයක් සඳහන්ව නොතිබුණද ඔවුන් එය යොදාගෙන තිබුණි.

(3) ණයකරවල පිරිවැය ගණනය කිරීමේදී අදාළ මුදල් ලැබීම් සහ ගෙවීම් හඳුනා ගැනීමට සමහර අපේක්ෂකයින් අපොහොසත් විය. ඔවුන් ලැබීම් සහ ගෙවීම් එකිනෙක මාරු කරගෙන තිබුණි. එසේම, නිදහස්කළ හැකි ණයකර නිකුත් කළ වර්ෂය පිළිබඳව ඔවුන්ට වැරදි අවබෝධයක් තිබූ අතර, ඒ නිසා පියවීම් වර්ෂයද වැරදි ලෙස සලකා තිබුණි.

(4) IRR සූත්‍රය ප්‍රකාශ කිරීමේදී සහ යෙදවීමේදී, විශේෂයෙන්ම සෘණ අගයන් හැසිරවීම සම්බන්ධයෙන් දෝෂ බහුලව දක්නට ලැබුණි.

(5) සමහරු වෙළඳපොළ අගය වෙනුවට පොත් අගය භාවිතයෙන් WACC ගණනය කර තිබුණි. වෙළඳපොළ අගයන් සැලකිල්ලට ගත යුතු බව ප්‍රශ්නයේ පැහැදිලිව සඳහන් කර තිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා :**

(1) ප්‍රශ්නය හොඳින් කියවා, ප්‍රශ්නයේ දී ඇති උපදෙස් පමණක් අනුගමනය කරන්න.

(2) IRR ගණනය කිරීමේදී, නිවැරදි සූත්‍රය සඳහන් කිරීමට සහ සුදුසු අගයන් යෙදවීමට සිසුන් වග බලා ගත යුතුය. සෘණ අගයන් හැසිරවීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

(3) ප්‍රශ්නයේ වෙනත් ආකාරයකට විශේෂයෙන් සඳහන් කර නොමැති නම්, WACC ගණනය කිරීම් සාමාන්‍යයෙන් පොත් අගයන්ට වඩා වෙළඳපොළ අගයන් මත පදනම් විය යුතු බව සිසුන් පැහැදිලිව වටහා ගත යුතුය.

(4) පසුගිය විභාග ප්‍රශ්න පුහුණු වීමටත්, සූත්‍ර සහ ඒවා නිවැරදිව යෙදවීම පිළිබඳව පැහැදිලි අවබෝධයක් වර්ධනය කර ගැනීමටත් සිසුන් දිරිමත් කරනු ලැබේ. ප්‍රශ්නය හොඳින් කියවීම සහ ගණනය කිරීමේ පියවර කෙරෙහි අවධානය යොමු කිරීම පොදු වැරදි අවම කර ගැනීමට උපකාරී වනු ඇත.

**කාර්යසාධනය:**

සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි. බොහෝ අපේක්ෂකයින් සාමාන්‍ය ඡන්ද හිමි කොටස්වල සහ නිදහස්කළනොහැකි වරණීය කොටස්වල පිරිවැය සාර්ථකව ගණනය කළද, අවසාන මට්ටමේදී බලාපොරොත්තු වන IRR ගණනය කිරීමේදී දුර්වලතා පෙන්විය

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නය මගින් 2026 ජූලි, අගෝස්තු සහ සැප්තැම්බර් මාස සඳහා මුදල් අයවැයක් සකස් කිරීම පිළිබඳව පරීක්ෂා කරන ලදී.

**විභාග අපේක්ෂකයින් විසින් සිදු කරන ලද පොදු වැරදි:**

(1) සමහර අපේක්ෂකයින් විසින් අවසාන මුදල් ශේෂය දක්වා නොතිබුණි.

(2) බොහෝ අපේක්ෂකයින් නිවැරදි පොලී අනුපාත (වසරකට 4% සහ 20%) හඳුනාගෙන තිබුණද, අදාළ මාස සඳහා මාසික පොලී ආදායම දැක්වීම පිණිස එම අනුපාත 12න් බෙදීමට ඔවුන් අපොහොසත් විය.

(3) සමහර අපේක්ෂකයින් ගණනය කිරීම්වලදී මුදල් ගලාඒම් නිවැරදිව ගණනය කර තිබුණද, ඒවා මුදල් අයවැයට ඇතුළත් කර නොතිබුණි.

(4) බොහෝ අපේක්ෂකයින්ට අදාළ මාසවලදී අමුද්‍රව්‍ය සහ සෘජු ශ්‍රමය සඳහා වන ගෙවීම් හඳුනා ගැනීමට නොහැකි විය.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා :**

(1) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර පුහුණු වන්න.

(2) ප්‍රශ්නය වඩාත් හොඳින් කියවා එහි අවශ්‍යතාවය වටහා ගන්න.

(3) විශේෂයෙන්ම ණයට විකිණීම්, මුදල් විකිණීම් සහ ගෙවීමේ කොන්දේසි සම්බන්ධයෙන් ප්‍රශ්නයේ සඳහන් ගනුදෙනු සිදුවන කාලවකවානු සිසුන් විසින් හොඳින් විශ්ලේෂණය කළ යුතුය.

**කාර්යසාධනයඃ**

මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි.

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නය මගින් පහත කරුණු පරීක්ෂා කරන ලදීඃ

- ලබා දී ඇති සම්පත් ලබා ගැනීමේ හැකියාව මත පදනම්ව සීමාකාරී සාධකය/සාධක හඳුනා ගැනීම, සහ
- හඳුනාගත් සීමාකාරී සම්පත මත පදනම්ව ප්‍රශස්ත නිෂ්පාදන මිශ්‍රණය ගණනය කිරීම.

**අපේක්ෂකයින් විසින් සිදු කරන ලද පොදු වැරදිඃ**

(1) අතිරික්ත/හිඟ සම්පත් ප්‍රමාණය නිවැරදිව හඳුනාගත් අපේක්ෂකයින් කිහිප දෙනෙකු අවසාන තීරණය වැරදි ලෙස ප්‍රකාශ කර තිබුණි. උදාහරණයක් ලෙස, x1 ද්‍රව්‍යයේ නිවැරදි අතිරික්ත ප්‍රමාණය හිඟයක් ලෙස සඳහන් කිරීම නිසා එම තීරණයට අදාළ ලකුණු අහිමි විය.

(2) සීමාකාරී සාධකය සඳහා කිලෝග්‍රෑමයකට ලැබෙන දායකත්වය ගණනය කිරීමේදී, සමහර අපේක්ෂකයින් ඒකකයකට ලැබෙන දායකත්වය ඒකකයකට අදාළ කිලෝග්‍රෑම් ගණනින් වැරදි ලෙස ගුණ කර තිබුණි.

(3) කෙසේ වෙතත්, සීමාකාරී සාධකය සඳහා ගණනය කරන ලද දායකත්වය මත පදනම්ව ශ්‍රේණිගත කිරීම නිවැරදිව සිදු කර තිබුණි.

(4) සමහරු ප්‍රශස්ත නිෂ්පාදන මිශ්‍රණය සඳහන් කර නොතිබුණි.

(5) සමහර අපේක්ෂකයින් ඒකකයකට ලැබෙන දායකත්වය ගණනය කර, එම දායකත්වය මත පමණක් පදනම්ව ශ්‍රේණිගත කිරීම සිදු කර තිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා :**

ඒකකයකට ලැබෙන දායකත්වය සහ සීමාකාරී සාධකයකට ලැබෙන දායකත්වය ගණනය කරන ආකාරය මෙන්ම, හඳුනාගත් සීමාකාරී සාධකය මත පදනම්ව ප්‍රශස්ත නිෂ්පාදන මිශ්‍රණය ගණනය කරන ආකාරය පිළිබඳව පුහුණුවීමට පසුගිය ප්‍රශ්න පත්‍ර භාවිත කරන්න.

**කාර්යසාධනයඃ**

බොහෝ අපේක්ෂකයින් අයවැයගත විකුණුම් අවශ්‍යතා සහ පවතින සම්පත් සංසන්දනය කිරීම මගින් සීමාකාරී සාධක නිවැරදිව හඳුනාගෙන තිබූ බැවින්, සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක පැවතුණි.

## C කොටස

### ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්නය සඳහා සමානුපාත ඒකක සහ පිරිවැය පිළිබඳ ප්‍රකාශනය සහ 1 වන පෙරසැරි ගිණුම සකස් කිරීම අවශ්‍ය විය.

**අපේක්ෂකයින් විසින් සිදු කරන ලද පොදු වැරදිඃ**

(1) සමහර අපේක්ෂකයින් ප්‍රශ්නයේ ලබා දී ඇති සංඛ්‍යා භාවිතයෙන් පෙරසැරි ගිණුම සහ සමානුපාත ඒකක ප්‍රකාශනය සකස් කර තිබුණද, වැඩිදුර ගණනය කිරීම් සිදු කිරීමට අපොහොසත් විය.

(2) සමානුපාත ඒකක ප්‍රකාශනය සකස් කිරීමේදී අපේක්ෂකයින් විසින් 'ආරම්භක නොනිමි වැඩ ඒකක ඇතුළත් කර තිබුණි.

(3) සමානුපාත ඒකක සහ පිරිවැය ප්‍රකාශනය සකස් කිරීමේදී සාමාන්‍ය අපතයේ සුන්බුන් වටිනාකම අඩු කර නොතිබීම හෝ ද්‍රව්‍ය, ශ්‍රමය සහ පොදු කාර්ය පිරිවැය ගණනය කිරීම් තුනෙන්ම එය අඩු කර තිබීම.

(4) සමානුපාතික ඒකක ගණන ගණනය කිරීමේදී සමහර අපේක්ෂකයින් සාමාන්‍ය අපතය ගැලපීම්වලට ලක් කර තිබුණි.

(5) අදාළ ඒකකවලට සමානුපාතික මුළු පිරිවැය හඳුනා ගැනීමේදී ආරම්භක නොනිමි වැඩ දක්වා නොතිබුණි.

(8) සමහර අපේක්ෂකයින් විසින් පෙරසැරි ගිණුමේ නිවැරදි ආකෘතිය හෝ පිරිවැය සහ සමානුපාත ඒකක දැක්වෙන ප්‍රකාශනය නිවැරදිව භාවිතා කර නොතිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා** ඃ

(1) අපේක්ෂකයින් මෙවැනිම ආකාරයේ ගැටළු විසඳීමට පුහුණු විය යුතුය.

(2) ස්වයං-අධ්‍යයන පාඨමාලා පොතෙහි අදාළ පරිච්ඡේද හොඳින් කියවා බැලීම නිර්දේශ කෙරේ.

**කාර්යසාධනයඃ**

කාර්ය සාධනය සතුටුදායක මට්ටමක පැවතුණි. 1 පෙරසැරි ගිණුම සකස් කිරීම මගින් අපේක්ෂකයින් ලකුණු ලබා ගත් නමුත්, සමානුපාත ඒකක සහ පිරිවැය පිළිබඳ ප්‍රකාශනය සකස් කිරීම සම්බන්ධයෙන් ඔවුන්ගේ දැනුම ප්‍රමාණවත් නොවීය; විශේෂයෙන්ම අසාමාන්‍ය අපතය සඳහා සමානුපාතික ඒකක ගණනය කිරීමේදී මෙය කැපී පෙනුණි.

## ප්‍රශ්න අංක 09

මෙම ප්‍රශ්නය මගින් නව නිෂ්පාදනයක් සඳහා වන ව්‍යාපෘතියක ආයෝජනය කිරීමේ යෝග්‍යතාවය ඇගයීම පරීක්ෂා කරන ලදී. මෙහිදී බදු ගැලපීම් සහිතව ශුද්ධ වර්තමාන අගය (NPV) ගණනය කිරීම සහ ආයෝජන තීරණය (එනම් ආයෝජනය පිළිගත යුතුද නැද්ද යන්න) පිළිබඳව තක්සේරු කිරීම අවශ්‍ය විය.

**විභාග අපේක්ෂකයින් විසින් සිදු කරන ලද පොදු වැරදි:**

(1) බොහෝ අපේක්ෂකයින් ආදායම් බදු ගෙවීම වැරදි ලෙස ගණනය කර තිබූ අතර, ක්ෂයවීම් සහ ප්‍රාග්ධන දීමනා ගැලපීම් භාවිතයෙන් බදු ගණනය කිරීම පිළිබඳ අවබෝධයක් නොමැති බව පෙන්නුම් කළහ.

(2) ප්‍රශ්නයේ 15% ක වට්ටම් අනුපාතයක් පැහැදිලිව සඳහන් කර තිබියදීත්, සමහර අපේක්ෂකයින් වෙනස් වට්ටම් අනුපාතයක් (ප්‍රාග්ධන පිරිවැය) භාවිතා කර තිබුණි.

(3) බොහෝ අපේක්ෂකයින්ගේ පිළිතුරුවල ගණනය කිරීමේ වැරදි රාශියක් දක්නට ලැබුණි. විශේෂයෙන්ම පිරිවැය සහ ආදායම සඳහා උද්ධමන ගැලපීම නිවැරදිව ගණනය කර නොතිබුණි.

(4) සමහර අපේක්ෂකයින් ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ පිරිවැය 0 වන වසරේදී සටහන් කරනවා වෙනුවට 1 වන වසරේදී වැරදි ලෙස සටහන් කර තිබුණි.

(5) සමහර අපේක්ෂකයින් ශුද්ධ වර්තමාන අගය ගණනය නොකරම තම තීරණය ඉදිරිපත් කර තිබුණි.

(6) ව්‍යාපෘති ඇගයීමේදී ප්‍රාග්ධන දීමනා මුදල් ප්‍රවාහයේ කොටසක් නොවේ; කෙසේ වෙතත්, බොහෝ අපේක්ෂකයින් ඒවා ව්‍යාපෘති ඇගයීමට වැරදි ලෙස ඇතුළත් කර තිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා :**

(1) පසුගිය විභාග ප්‍රශ්න පත්‍රවලින් මෙවැනිම ආකාරයේ ප්‍රශ්න පුහුණු වන්න.

(2) වට්ටම් කිරීමේ කටයුතු සඳහා ප්‍රශ්නයේ දී ඇති ප්‍රාග්ධන පිරිවැය (වට්ටම් සාධකය) භාවිතා කරන්න.

(3) ගිණුම්කරණ ලාභය සහ බදු අය කළ හැකි ලාභය අතර වෙනස වටහා ගැනීම අවශ්‍ය වේ.

(4) ගණනය කිරීමේ වැරදි අවම කරගන්න.

(5) මුදල් ලැබීම් සහ මුදල් ගෙවීම්වල අර්ථය වටහාගෙන, යෝජිත ආයෝජන ව්‍යාපෘතියට අදාළ මුදල් ලැබීම් සහ ගෙවීම් නිවැරදිව හඳුනා ගන්න.

**කාර්යසාධනය:**

මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්ය සාධනය සාමාන්‍ය මට්ටමක පැවතුණි.

## ප්‍රශ්න අංක 10

(A)

මෙම ප්‍රශ්නයේ **(a) කොටස** මගින් විචලන විශ්ලේෂණය පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී. එහිදී විකුණුම් මිල විචලනය, ඍජු ද්‍රව්‍ය මිල විචලනය, ද්‍රව්‍ය මිශ්‍රණ විචලනය සහ ද්‍රව්‍ය ඵලදා විචලනය ගණනය කිරීම අවශ්‍ය විය.

**(b) කොටස** මගින් මෙහෙයුම් ප්‍රකාශනයක් සකස් කිරීම පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදී.

**විභාග අපේක්ෂකයින් විසින් සිදු කරන ලද පොදු වැරදි:**

(1) බොහෝ අපේක්ෂකයින්ට විචලන ගණනය කිරීමේ සූත්‍ර පිළිබඳ දැනුමක් නොතිබුණි.

(2) සූත්‍ර නිවැරදිව දැන සිටි සමහර අපේක්ෂකයින්ට, අදාළ සූත්‍රය සඳහා දත්ත නිවැරදිව යෙදවීමට නොහැකි විය

(3) ඍජු ද්‍රව්‍ය මිශ්‍රණ සහ ඵලදා විචලනයන් අතර ඇතිවන ව්‍යාකුලත්වය:

- ඍජු ද්‍රව්‍ය මිශ්‍රණ විචලනය ගණනය කිරීමේදී, සත්‍ය මුළු ප්‍රමාණයට ප්‍රමිතිගත අනුපාත යෙදීම වෙනුවට සත්‍ය ප්‍රමාණයන් වැරදි ලෙස භාවිතා කිරීම.
- ඍජු ද්‍රව්‍ය ඵලදා විචලනය ගණනය කිරීමේදී, ප්‍රමිතිගත ප්‍රමාණයන් භාවිතා නොකර සත්‍ය ප්‍රමාණයන් භාවිතා කිරීම සහ සත්‍ය නිෂ්පාදනයට අනුකූල වන පරිදි ප්‍රමිතිගත ප්‍රමාණයන් ගැලපීමට අපොහොසත් වීම.

(4) ගණනය කරන ලද විචලනය වාසිසහගතද නැතහොත් අවාසිසහගතද ද යන්න සමහර අපේක්ෂකයින් සඳහන් කර නොතිබුණි.

(5) සමහරු වාසිසහගත තත්ත්වය අවාසිසහගත ලෙසත්, අවාසිසහගත තත්ත්වය වාසිසහගත ලෙසත් වැරදි ලෙස හඳුනාගෙන තිබුණි.

(6) සමහර සිසුන් ගණනය කිරීමේ දෝෂවලට මුහුණ දුන් අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වැරදි අවාසිසහගත සහ වාසිසහගත තත්ත්වයන් ඉදිරිපත් කර තිබුණි.

(7) මෙහෙයුම් ප්‍රකාශනය සකස් කිරීමේදී, අවාසි (A) සහ වාසි (F) සංකේත වැරදි ලෙස සැලකීම නිසා අයවැයගත දායකත්වය සහ සත්‍ය දායකත්වය අතර සන්සන්දනය කිරීමේදී දෝෂ ඇතිවීම.

**(B) කළමනාකරණ ගිණුම්කරණයේදී තාක්ෂණය භාවිත කිරීමේ වාසි:**

**(a)** කළමනාකරණ ගිණුම්කරණයේදී තාක්ෂණය භාවිත කිරීමේ වාසි පිළිබඳ ප්‍රශ්නයට බොහෝ සිසුන් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

**(b)** තොග කළමනාකරණය සඳහා පවතින මෘදුකාංග පැකේජ පිළිබඳ ප්‍රශ්නයට ඉතා සුළු සිසුන් පිරිසක් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. බොහෝ සිසුන් තොග කළමනාකරණය සඳහා විශේෂයෙන් භාවිතා කරන පැකේජ වෙනුවට QuickBooks, Sage සහ ERP පද්ධති වැනි සාමාන්‍ය ගිණුම්කරණ පැකේජ ලැයිස්තුගත කර තිබුණි.

**විභාග පරීක්ෂකවරුන්ගේ යෝජනා :**

(1) පසුගිය විභාග ප්‍රශ්න පත්‍රවලින් සමාන ආකාරයේ ප්‍රශ්න පුහුණු වන්න. සෑම විටම ඔබේ ගණනය කිරීමේ පියවර (working) පෙන්වන්න.

(2) ස්ව අධ්‍යයන පොත අනුගමනය කර ප්‍රායෝගික යෙදවුම් සිදු කරන්න.

(3) සිසුන් විවිධ අවස්ථාවන් සඳහා විචලනවලට අදාළ සූත්‍ර පුහුණු විය යුතුය.

(4) විචලන විශ්ලේෂණයේදී සූත්‍ර නිවැරදිව යෙදීම සහ ඉදිරිපත් කිරීම.

**කාර්ය සාධනයඃ**

මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්ය සාධනය සතුටුදායක මට්ටමක නොතිබුණි. බොහෝ අපේක්ෂකයින්ට සෘජු ද්‍රව්‍ය මිශ්‍රණ විචලනය සහ සෘජු ද්‍රව්‍ය ඵලදා විචලනය ගණනය කිරීම අපහසු විය.

-- - --